මගේ අංකය: 3/5/405/VII
මානව සම්පත් කළමනාකරණ අංශය
රාජ්‍ය දැව සංස්ථාව
2026.04.27

සාමාන්‍යාධිකාරි,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්,
සහකාර සාමාන්‍යාධිකාරිවරුන්,
කළමනාකරුවන්,
ප්‍රාදේශිය කළමනාකරුවන්,
නියෝජ්‍ය කළමනාකරුවන් (ගෘහ භාණ්ඩ සංකිර්ණ /විමර්ශන / යාන්ත්‍රික ඉංජිනේරු),
ඒකක ප්‍රධානින්,
සංස්ථාවේ සියළුම සේවකයින් වෙත.

## <u>පුරප්පාඩු</u>

පහත සදහන් තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැදවනු ලැබේ.

අයදුම්පත් 2026.05.20 දින හෝ ඊට පෙර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන) වෙත ලැබෙන සේ එවිය යුතුය. තැපෑලේ දි අස්ථාන ගතවන අයදුම්පත් පිළිබදව වගකියනු නොලබන බව මින් දන්වමි.

අභ්‍යන්තර / බාහිර අයදුම්පත් රාජ්‍ය දැව සංස්ථාවේ නිල වෙබ් අඩවියට (www.timco.lk)වෙත පිවිස බාගතකර අංශ ප්‍රධානියා/ ප්‍රදේශීය කළමනාකරු/ ඒකක ප්‍රධානි මගින් ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ , අපැහිදිලි , අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසු ලැබෙන හෝ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් පූර්ව දැනුම් දිමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම් කරන සියළුම ස්ථිර සේවකයින් සම්බන්ධව සේවා ඇගයීම් වාර්තාවක් අංශ ප්‍රධානීන් විසින් රහස්‍යව මා වෙත ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

අනියම් හෝ වෙනත් පදනමක් මත සේවයේ නියුතු පුද්ගලයින්ට බාහිර සුදුසුකම් යටතේ අයදුම් කළ යුතු අතර ඔවුන් විසින් මෙම අයදුම්පත් පෞද්ගලිකවම දැනට සේවය කරන අංශය / ඒකකය, අදාල අංශ /ඒකක ප්‍රධානියා මගින් ලබාගත් සේවා සහතිකයක්ද සමඟ එවිය යුතු වේ.

# 1. සාමාන්‍යාධිකාරි - *(HM 2-2)*

- **සුදුසුකම් ( 1 හෝ 2 )**

<u>**බාහිර අයදුම්කරුවන් සඳහා**</u>

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබිම.

**සහ**

විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය /කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබිම හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආයතනික සාමාජිකත්වයක් ලබා තිබිම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක" කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර විස්සක (20) පළපුරුද්දක් ලබා තිබීම හා ඉන් වසර පහක් (05) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

**2.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක්

සහ

විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම

## <u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u>

ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-2) සේවා ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහක (05)ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 2-1) සේවා ශ්‍රේණියෙහි අතිරේක සාමාන්‍යාධිකාරි වශයෙන් අවම වශයෙන් වසර දෙකක (02)ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

බහුවිධ කණ්ඩායම් මෙහෙයවීමේ හා නායකත්වය දීමේ හැකියාව හා මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීම සහ කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද.

- **වැටුප් පරිමාණය** : HM 2-2 – 2025 රු. (163,620 – 4,850 × 12 = 221,820)
  **( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**

- **වයස් සීමාව** : **වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.**

- **බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මත තෝරා ගැනීම සිදු කෙරේ.

- **ඉහත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | -ලකුණු 30 |
| අදාල අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | -ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | -ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදි කාර්යය සාධනය | -<u>ලකුණු 25</u> |
| | <u>උපරිම ලකුණු 100</u> |

- **ස්ථිර කිරීම**

බාහිර අයදුම්කරුවන් අතරින් පත්කරනු ලබන නිලධාරියෙකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේදි සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරකට වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කෙරේ.

# 2. අතිරේක සාමාන්‍යාධිකාරි (HM 2-1)

- **සුදුසුකම් (1, 2 හෝ 3)**

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>**

**1.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය/ කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සමඟ**

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවු , පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම.

**සහ**

සංස්ථාවක / ව්‍යස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ " තනතුරක අවම වශයෙන් වසර දහඅටක (18) ක පළපුරුද්දක් ලබා තිබීම හා ඉන් වසර පහක් (05) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

**2.** තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

සංස්ථාවක , ව්‍යස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ " තනතුරක අවම වශයෙන් වසර දහඅටක (18) ක පළපුරුද්දක් ලබා තිබීම හා ඉන් වසර පහක් (05) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

**3.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය/ කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සහ**

ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ඕනෑම ආචාර්ය උපාධියක් ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

## <u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u>

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (HM 1-2) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර තුනක (03) ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

බහුවිධ කණ්ඩායම් මෙහෙයවීමේ හා නායකත්වය දීමේ හැකියාව හා මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීම සහ කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද.

- **වැටුප් පරිමාණය** : HM 2-1 – 2025 ( රු. 161,140 – 4,850 × 12 = 219,340)
  **( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**

- **වයස් සීමාව** : **වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.**

- **බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මත තෝරා ගැනීම සිදු කෙරේ.

- **ඉහත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | -ලකුණු 30 |
| අදාල අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | -ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | -ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදි කාර්යය සාධනය | -<u>ලකුණු 25</u> |
| | <u>උපරිම ලකුණු 100</u> |

- **ස්ථිර කිරීම**

බාහිර අයදුම්කරුවන් අතරින් පත්කරනු ලබන නිලධාරියෙකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේදි සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරකට වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කෙරේ

## 3. සහකාර කළමනාකාර (මානව සම්පත්) -(JM 1-1)

- **සුදුසුකම්**

<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය /රාජ්‍ය කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳව උපාධියක් ලබා තිබීම.

<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II)</u>

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

II. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA-1) සේවා ගණයෙහි 11 ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වැටුප් පරිමාණය** **:JM 1-1 –(රු .72,650 – 1,360×10 – 2,040×18 – 122,970)**
  **( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**

- **බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මත තෝරා ගැනීම සිදු කෙරේ.

- **ඉහත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාල අතිරේක සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

- **වයස** : වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

- **ස්ථිර කිරිම**

බාහිර අයදුම්කරුවන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලබන අතර, අභ්‍යන්තර අයුදුම්කරුවන් වසර එකක (01) වැඩ බැලීමේ තත්ත්වයක තබනු ඇත.

# 4. වැඩබිම් නිලධාරී - (MA 1-2)

- **සුදුසුකම්**

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>**

සිංහල /දෙමළ සහ ගණිතය යන විෂයන් ඇතුලත්ව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය එකවර සමත්වීම

**සහ**

අ.පො.ස (උ.පෙළ) විභාගය විද්‍යා හෝ වාණිජ හෝ කලා විෂය ධාරාවෙන් විෂයන් 03ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර ) සමත් වීම.

**<u>අභ්‍යන්තර අයදූම්කරුවන් සඳහා</u>**

පහත සඳහන් සුදුසකම් සපුරා ඇති ප්‍රාථමික මට්ටමේ -ශිල්පීය(PL-3), ප්‍රාථමික මට්ටමේ- අර්ධ ශිල්පීය(PL-2) සහ ප්‍රාථමික මට්ටමේ - ශිල්පීය නොවන(PL-1) යන කාණ්ඩවල සේවකයින් අයදූම් කිරීමට සුදුසුකම් ලබයි.

<u>අධ්‍යාපන සුදුසුකම්</u>

සිංහල /දෙමළ සහ ගණිතය යන විෂයන් ඇතුලත්ව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම

<u>වෙනත්</u>

ඉහත සේවක කාණ්ඩය යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

- වැටුප් පරිමාණය :MA 1-2-2025 (රු. 46,220/ –540×10 – 630×07 – 1080 x12-1,280x12 – 84,350)

  ( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)

- වයස් සීමාව : වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදූම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

- රැකියා විස්තරය :

  I. වැඩබිම්වල (Coupes) මායිම් ලකුණුකිරීම සහ ගණනය කිරීම සිදු කිරීම
  II. සැපයුම් කොන්ත්‍රාත්කරුවන් සමඟ කරන ලද කාර්ය ගිවිසුම් කළමනාකරණය කිරීම.
  III. දැව හෙලීම් හා ප්‍රවාහනය කරන ස්ථානවල කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ අධීක්ෂණය කිරීම.
  IV. නියමිත ගබඩා ස්ථාන වෙත යැවීම සඳහා නිකුත් කිරීමේ උපදෙස් අනුව වනයෙන් දැව නිකුත් කිරීම.

- **බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරික්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්‍ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මත තෝරා ගැනීම සිදු කෙරේ.

**ඉහත තනතුරු සඳහා සම්මුඛ පරික්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාල අතිරේක අධ්‍යාපන සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරික්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

- **වයස** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

- **ස්ථිර කිරීම**

බාහිර අයදුම්කරුවන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලබන අතර, අභ්‍යන්තර අයුදුම්කරුවන් වසර එකක (01) වැඩ බැලීමේ තත්ත්වයක තබනු ඇත.

# 5. බර යන්ත්‍ර ක්‍රියාකරු (PL 3)

- **සුදුසුකම්**

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>**

ක්ෂේත්‍රයට අදාලව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතරවැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II)</u>**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. අදාළ ක්ෂේත්‍රයේහි වසර පහක (05) පළපුරුද්ද සමහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තිය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන, වෘත්තිය පරීක්‍ෂණයක (Trade Test) දී ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමක ප්‍රවීනතාවය ලබා ඇති ප්‍රාථමික (අර්ධ ශිල්පිය) (PL -2) හෝ ප්‍රාථමික (ශිල්පීය නොවන) (PL -1) සේවා ගණයේ සේවකයින්.

- වැටුප් පරිමාණය : PL 3- 2025 රු. (43,280 - 490×10 - 540×10 - 590×10 - 630×12 – 67,040)
( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)

- වයස : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

- **රැකියා විස්තරය :**

  I. ෆෝක්ලිෆ්ට් (Fork Lifters), ෆ්‍රොන්ට් එන්ඩ් ලෝඩර්ස් (Front End Loaders), ක්‍රෝලර් ට්‍රැක්ටර්ස් (Crawler Tractors), ටිම්බර් ජැක්ස් (Timber Jacks), බුල්ඩෝසර්ස් (Bulldozers), කැටපිලර් යන්ත්‍ර (Caterpillars), පොක්ලන්ඩ් (Pock land) සහ අනෙකුත් බර යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම.
  II. බර යන්ත්‍රවල සුළු අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කිරීම

# 6. බොයිලර් හා උදුන් ක්‍රියාකරු (PL- 3)

- **සුදුසුකම්**

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>**

ක්ෂේත්‍රයට අදාලව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතරවැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II)</u>**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. අදාළ ක්ෂේත්‍රයේහි වසර පහක (05) පළපුරුද්ද සමඟ කාර්මික විද්‍යාලයකින් / වෘත්තිය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන, වෘත්තිය පරීක්ෂණයක (Trade Test) දී ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමක ප්‍රවීනතාවය ලබා ඇති ප්‍රාථමික (අර්ධ ශිල්පීය) (PL -2) හෝ ප්‍රාථමික (ශිල්පීය නොවන) (PL -1) සේවා ගණයේ සේවකයින්.

- **වැටුප් පරිමාණය** : PL- 3- 2025 (රු. 43,280 - 490×10 - 540×10 - 590×10 - 630×12 – 67,040)
  ( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)

- **වයස** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

- **රැකියා විස්තරය :**

  I. බොයිලේරු සහ උදුන් ක්‍රියාත්මක කිරීම
  II. බොයිලේරු සහ උදුන් අලුත්වැඩියා සහ නඩත්තු කිරීම.
  III. ආදාන(Input) සහ ප්‍රතිදාන(Output) සම්බන්ධ වාර්තා නඩත්තු කිරීම.

# 7. යන්ත්‍රාගාර ක්‍රියාකරු (PL- 3)

- **සුදුසුකම්**

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>**

ක්ෂේත්‍රයට අදාලව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතරවැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II)</u>**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
ii. අදාළ ක්ෂේත්‍රයේහි වසර පහක (05) පළපුරුද්ද සමඟ කාර්මික විද්‍යාලයකින් / වෘත්තිය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකුල වන, වෘත්තිය පරික්ෂණයක (Trade Test) දි ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමක ප්‍රවීනතාවය ලබා ඇති ප්‍රාථමික (අර්ධ ශිල්පිය) (PL -2) හෝ ප්‍රාථමික (ශිල්පීය නොවන) (PL -1) සේවා ගණයේ සේවකයින්.

- වැටුප් පරිමාණය : **PL 3- 2025 රු. (43,280 - 490×10 - 540×10 - 590×10 - 630×12 – 67,040) ( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**

- **වයස** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

- රැකියා විස්තරය :
  I. ඉම්ප්‍රෙග්නේෂන් (Impregnation) යන්ත්‍රාගාර ක්‍රියාත්මක කිරීම.
  II. යන්ත්‍රාගාර අලුත්වැඩියා සහ නඩත්තු කිරීම.
  III. ආදාන (Input) සහ ප්‍රතිදාන(Output) සම්බන්ධ වාර්තා නඩත්තු කිරීම

# 8. ඉරුම්කරු (PL 3)

- **සුදුසුකම්**

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>**

ක්ෂේත්‍රයට අදාලව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතරවැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II)</u>**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. අදාළ ක්ෂේත්‍රයේහි වසර පහක (05) පළපුරුද්ද සමඟ කාර්මික විද්‍යාලයකින් / වෘත්තිය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකුල වන, වෘත්තිය පරික්ෂණයක (Trade Test) දි ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමක

ප්‍රවීනතාවය ලබා ඇති ප්‍රාථමික (අර්ධ ශිල්පීය) (PL -2) හෝ ප්‍රාථමික (ශිල්පීය නොවන) (PL -1) සේවා ගණයේ සේවකයින්.

- **වැටුප් පරිමාණය : PL 3- 2025 රු. (43,280 - 490×10 - 540×10 - 590×10 - 630×12 – 67,040) ( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**

- **රැකියා විස්තරය :**
  I. සංස්ථාව භාවිතා කරන සියලුම වර්ගයේ ඉරුම්හල් (Saw Mills) ක්‍රියාත්මක කිරීම.
  II. ඉරුම්හල් අලුත්වැඩියා සහ නඩත්තු කිරීම.
  III. ආදාන (Input), අපේක්ෂිත ප්‍රතිදාන(Expected Output), සැබෑ ප්‍රතිදාන(Actual Output) සහ අපද්‍රව්‍ය පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම.
  IV. අනතුරු (accidents) සහ යන්ත්‍ර දෝෂ (breakdowns) වාර්තා කිරීම.

- **බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මත තෝරා ගැනීම සිදු කෙරේ.

**ඉහත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | - ලකුණු 20 |
| අදාල අතිරේක පලපුරුද්ද | - ලකුණු 20 |
| සම්මුඛ පරීක්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 60 |
| | උපරිම ලකුණු 100 |

- **වයස** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

- **ස්ථිර කිරිම**

බාහිර අයදුම්කරුවන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලබන අතර, අභ්‍යන්තර අයුදුම්කරුවන් වසර එකක (01) වැඩ බැලීමේ තත්ත්වයක තබනු ඇත.

# 9. දම්වැල් කියත් ක්‍රියාකරු (PL-2)

- **සුදුසුකම්**

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>**

ක්ෂේත්‍රයට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි ( 02) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II)</u>**

**I.** ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

II. අදාළ ක්ෂේත්‍රයේහි වසර පහක (05) පළපුරුද්ද සමග කාර්මික විද්‍යාලයකින් / වෘත්තිය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන, වෘත්තිය පරීක්ෂණයක (Trade Test) දී ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමක ප්‍රවීනතාවය ලබා ඇති ශිල්පීය නොවන (PL -1) සේවා ගණයේ සේවකයින්.

- **වැටුප් පරිමාණය : PL- 2- 2025 රු. (42,300 - 490×10 - 540×10 - 590×10 - 630×12 – 66,060) ( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2025 හි II උපලේඛනය අනුව 2025.01.01 දින සිට)**
- **රැකියා විස්තරය :**
    I. දම්වැල් කියත් භාවිතයෙන් ගස් හෙලීම් හා කඳන් කිරිමේ කටයුතු සිදු කිරීම.
    II. දම්වැල් කියත් අලුත්වැඩියා සහ නඩත්තු කිරීම.

- **බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරික්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මත තෝරා ගැනීම සිදු කෙරේ.

**ඉහත තනතුරු සඳහා සම්මුඛ පරික්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක අධ්‍යාපන/වෘත්තිය සුදුසුකම් | - ලකුණු 20 |
| අදාල අතිරේක පලපුරුද්ද | - ලකුණු 20 |
| සම්මුඛ පරික්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 60 |
| | උපරිම ලකුණු 100 |

- **වයස** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.
- **ස්ථිර කිරිම**

බාහිර අයදුම්කරුවන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලබන අතර, අභ්‍යන්තර අයුදුම්කරුවන් වසර එකක (01) වැඩ බැලීමේ තත්ත්වයක තබනු ඇත.

## වෙනත් ප්‍රතිලාභ

- සේවකයන් සහ යැපෙන්නන් සඳහා වෛද්‍ය රක්ෂණ
- වාර්ෂික ප්‍රසාද දීමනා
- පැමිණීමේ දිරිදීමනාව
- නිවාස ණය සහ වෙනත් ණය පහසුකම්
- සේ.අ.අ. සහ සේ.භා.අ. සඳහා දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාව පිළිබඳ විස්තර, තනතුරුවලට අදාල රාජකාරි, වගකිම් සහ සේවා කොන්දේසි සහ ආදර්ශ අයදුම්පත්‍රය වෙත පිවිසිමට පහත සපයා ඇති **QR** කේතය ස්කෑන් **(Scan)** කරන්න.

**අයදුම්කල යුතු ආකාරය**

අයදුම්කරුවන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව සකස් කරන ලද  අයදුම්පත සහ මූලික සුදුසුකම් සනාථ කිරිම සඳහා  අදාල සහතිකවල සහතික කල පිටපත් 2026 මැයි මස 20 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මානව සම්පත් හා පාලන), අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල** යන ලිපිනයට  ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.
සැ.යු - අපැහැදිලි, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර එවීමට  ප්‍රමාද වූ හෝ මූලික සුදුසුකම් සපුරා නොමැති  අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ .

සභාපති - රාජ්‍ය දැව සංස්ථාව